# ජර්මන් යුවළකගෙන් රුපියල් ලක්ෂ දොළහක පරිත්‍යාග
# සුනාමියෙන් අවතැන් තංගල්ලේ ගුරු සිසු පිරිසකට

(විස්තර හා ඡායාරූප
බෙන්තොට ජේ. ඉදුරුවගේ)

බෙන්තොට තරුණයන් දෙදෙනකුගේ මැදිහත්වීමෙන් ජර්මන් ජාතික අඹුසැමි යුවළක විසින් රුපියල් දොළොස් ලක්ෂයකට අධික වටිනාකමකින් යුත් ද්‍රව්‍යාධාර තොගයක් සුනාමියෙන් අවතැන්වූ සහ පීඩාවට පත් තංගල්ලේ ගුරු සිසු පිරිසකට පරිත්‍යාග කරන ලදී.

මෙම සද්කාර්ය කළේ මෙරට සංචාරයක් සඳහා පැමිණ බෙන්තොට සංචාරක හෝටලයක නතරවී සිටින ජර්මන් ජාතික හාන්ස් හයින්රිච්ස් මහතා හා ඔහුගේ බිරිය ක්‍රිස්ටින් හයින්රිච්ස් මහත්මියයි. ඔවුන්ගේ මිතුරියකවූ ඩැග්මර් කෝච් ද මේ සඳහා සහාය දැක්වූවාය.

මොවුන් මේ සද්කාර්ය සඳහා යොමු කළ ආදර්ශවත් තරුණයන් දෙදෙනා වූයේ බෙන්තොට පදිංචි කමල් වසන්ත ගල්බඩආරච්චි හා බන්දුල බද්දවිතානයි.

විදේශික යුවළ මේ තරුණයන්ගේ මිතුරෝ වූහ. තමන්ට කරන්නාවූ උපකාරයක් සේ සලකා සුනාමියෙන් අවතැන්ව සිටින පිරිසකට හැකි උපකාරයක් කරන්නැයි ඔවුන් විසින් කරන ලද ඉල්ලීම



තංගල්ල බාලිකා ජාතික පාසලේදී හාන්ස් මහතා අතින් ධනංජි ලක්ෂිතා සිසුවිය පරිත්‍යාගය ලැබූ අයුරු.

පිළිගත් විදේශික යුවළ ඒ සඳහා රුපියල් ලක්ෂ දොළහක් වෙන්කර තිබුණි.

තමන් උගත් බෙන්තොට ගාමිණී විදුහලේ විදුහල්පති ඩබ්ලිව්. බී. නිමල්සිරි මහතා සමඟද සාකච්ඡා කර මෙම මුදලින් තංගල්ලේ පාසල් තුනක සුනාමියෙන් පීඩාවට පත් ගුරු සිසු පිරිසකට ද්‍රව්‍යාධාර ලබාදීම සිදු කෙරිණි.

තංගල්ල බාලිකා මහා විද්‍යාලය, තංගල්ල පිරිමි ජාතික පාසල හා තංගල්ල රාහුල මහා විදුහල යන පාසල් තුනේ ගුරුවර ගුරුවරියන් 35 දෙනෙකුටද, සිසු සිසුවියන් විශාල සංඛ්‍යාවකටද මෙම ද්‍රව්‍යාධාර එම විදුහල්වලදීම පැවැති චාම් උත්සවවලදී විදේශික යුවළ අතින්ම බෙදා දෙන ලදී.

මහන මැෂින්, මුළුතැන්ගෙයි විද්‍යුත් උපකරණ, මෙට්ට, ඇඳුම් වර්ග, මදුරු දැල්, පාපැදි, කිරි පිටි, වානේ අල්මාරි, පුටු ආදී වටිනා උපකරණ මෙම ද්‍රව්‍යාධාර අතර විය.

මෙම පරිත්‍යාග ලබාගත් ඇතැම් ගුරුවරුන් හා සිසුන්ගේ නෙත්වල සතුටු කඳුළු පිරී තිබුණි.

බෙන්තොට, ගාමිණී ජාතික පාසලේ විදුහල්පති ඩබ්ලිව්. බී. නිමල්සිරි මහතා මෙම සියලු කටයුතු සංවිධානය කළේය.



තංගල්ල පිරිමි ජාතික පාසලේදී ජේ. නිගමුනි ගුරු මහතා පරිත්‍යාග බාර ගනිමින්



සද්කාර්යට දායකවූ පිරිස (දකුණේ සිට) කමල්, බන්දුල, ක්‍රිස්ටින් (වාඩිවී), ඩැග්මර්, නිමල්සිරි, හාන්ස් සහ ගලප්පත්ති යන මහත්ම මහත්මීහු.

Übersetzung:

Ein Paar aus Deutschland unterstützt mit € 12.000 Tsunami-Betroffene (Schüler und Lehrer) in Thangalle

Bericht und Fotos: Bentota J. Iduruwage

Über Kamal Wasanthe und Bandula Badhawithane aus Bentota wurden verschiedene Gegenstände im Wert von € 12.000 für die Schulen in Thangalle gekauft.

Christine und Hans Heinrichs aus Deutschland haben zusammen mit Dagmar Koch diese Initiative ermöglicht. Christine und Hans Heinrichs sind seit langer Zeit Freunde von Kamal und Bandula und haben die beiden auch schon in der Vergangenheit unterstützt. Als die Tsunami-Katastrophe passierte, fragten Kamal und Bandula bei Hans und Christine an, ob sie den Tsunami-Opfern helfen können.
Kamal und Bandula gingen früher in Bentota zur Gamini-Schule. Über ihren früheren Schulleiter W.B. Nimalsiri wurde der Kontakt zu den Partnerschulen in Thangalle hergestellt.

Die 3 Schulen in Thangalle heißen:
1. Thangalle Balika Mahawidyalaye (Mädchenschule)
2. Thangalle Pirimi Jathike Pasale (Jungenschule)
3. Thangalle Rahula Mahawidyalaye (Gemischte Grundschule)

Bei einer kleinen Feierstunde wurden die Gegenstände an die anwesenden 35 Lehrkräfte und an die Schülerinnen und Schüler übergeben.

Es handelt sich bei der Übergabe um folgende Gegenstände: Nähmaschinen, Matratzen, verschiedene Kleidungsstücke, Moskitonetze, Schränke, Stühle, Reiskocher, Gaskocher, Fahrräder, Küchengeräte und Milchprodukte.

Alle Anwesenden waren durch diese Initiative bei der Übergabe so gerührt, dass viele, - aber dieses Mal glückliche - Tränen vergossen wurden.

Diese Feierstunde hatte der Rektor der Bentota-Gamini-National-School organisiert.

Bilder:
1. oben links: Übergabe eines Präsentes von Hans Heinrichs an Dananji Lakschita
2. oben rechts: Übergabe eines Präsentes an den Lehrer J. Nigamuni
3. unten rechts: von rechts nach links: Kamal, Bandula, Christine (sitzend), Dagmar, Nimalsiri, Hans, Galappathi